සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Provincial Education - NWP

7 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 15 S

## ක්‍රිස්තියානි ධර්මය

නම ..............................................

කාලය පැය දෙකයි

උපදෙස් : සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න,

### I කොටස

නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. දෙවියන් වහන්සේ මනුෂ්‍යයා නිර්මාණය කළේ.
    1. දේව බලයෙන් ය.   2. පොළොවේ දූවිල්ලෙන් ය.
    3. තම හස්තයෙන් ය.   4. වචනයේ බලයෙන් ය.

02. අපේ එදිනෙදා අවශ්‍යතා ගැන අප,
    1. කරදර විය යුතු ය.   2. බලාපොරොත්තු විය යුතු ය.
    3. කනස්සලු විය යුතු ය.   4. දෙවිඳුන්ට භාර කළ යුතු ය.

03. ජේසුස් වහස්සේට පැමිණි පරීක්ෂා ගණන වන්නේ,
    1. 03 කි.   2. 04 කි.   3. 07 කි   4. 2 කි.

04. පාළුකරයේ මොර ගසන හඬ ලෙස හඳුන්වනු ලබන්නේ,
    1. ආදම් ය.   2. මෝසෙස් ය.   3. ස්නාවක ජොහාන් ය.   4. නෝවා ය.

05. ජේසුස් වහන්සේ පාළුකරයෙහි නිරාහාරව යාච්ඤා කළ දින ගණන වන්නේ දින,
    1. 30 කි.   2. 40 කි.   3. 20 කි.   4. 10 කි.

අංක 06 සිට 10 දක්වා දැක්වෙන ප්‍රකාශ හරිනම් ( ✓ )ලකුණද, වැරදි නම් ( × ) ලකුණද යොදන්න.

06. අපි සැම අවස්ථාවකදීම යහපතට මුල්තැන දී ක්‍රියා කළ යුතු ය. (      )
07. පළගැටියන් හා වන මී ආහාරයට ගත්තේ ජේසුස් වහන්සේ ය (      )
08. දේව මැවිල්ල තුළ අපට රැකවරණය ඇත. (      )
09. දෙවියන් වහන්සේට අවිශ්වාසව ජීවත්වීම කිතුනු අපේ යුතුකමයි. (      )
10. '' ගල් පාන් බවට පත් කිරීම '' ජේසුස් තුමාට පැමිණි පරීක්ෂාවකි (      )

අංක 11 සිට 15 තෙක් ප්‍රශ්ණ වලට A කොටසේ දැක්වෙන වගන්ති හා ගැළපෙන නිවැරදි පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.

| A | B |
|---|---|
| 11. පවුලේ නිර්මාතෘවරයා | පෙරමග දූතයා ය. |
| 12. දේව මැවිලි අතර උතුම්ම මැවිල්ල | ප්‍රඥාවේ උල්පත වේ. |
| 13. ස්භාවක ජොහාන් තුමා, ජේසුස් වහන්සේගේ | දෙවියන් වහන්සේ |
| 14. ඔබ ලෝකයේ | මනුෂ්‍යයා. |
| 15. දේව ගරු බිය පැම යනු | ආලෝකය ය. |

අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

(සමිදානන් වහන්සේ, ස්නාවක ජොහාන්, ඒදන් උයනේ, ක්‍රියාවෙන්, ධර්මිෂ්ඨකම)

16. දෙවියන් වහන්සේ මිනිසා මවා ............................................. පදිංචි කරවූ සේක.

17. සිතින්, වචනයෙන් .................................................. අපේ පව් පිළිබඳ පසුතැවිලි විය යුතුය.

18. නුඹේ දෙවි වන ........................................... පරික්ෂා නොකරන්න.

19. සෙකරියස් හා එළිසබෙත්ගේ පුත්‍රයා ............................................... ය.

20. එහෙත් පළමු කොට උන් වහන්සේගේ රාජ්‍යය ද, ............................................... ද සොයන්න.

---

## II කොටස

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්ණ 05කට පිළිතුරු සපයන්න.

01. කෙටි පිළිතුරු සපයන්න.

(i) ජුදා සමාජය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ ජන කණ්ඩායම් 02 ක් ලියන්න.

(ii) ජේසුස් වහන්සේ තම ඉගැන්වීම් සඳහා තෝරා ගත් ස්ථාන 02 ක් ලියන්න.

(iii) බයිබලයේ සඳහන් ''රන් අණ'' ලියන්න.

(iv) ස්නාවක ජොහාන් තුමාගේ චරිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ 02 ක් ලියන්න.

(v) ළමා අයිතීන් සුරකීම උදෙසා ක්‍රියාත්මක වන ආයතන 02 ක් ලියන්න.

(vi) දේව ප්‍රේමයෙන් අප ලද වටිනාකම් සමාජය වෙත දායාද කළ යුතු ආකාර 02 ක් ලියන්න.

(vii) ජේසුස් වහන්සේ තම දේශනා හා ඉගැන්වීම්, ජුදෙව් සමාජයේ ජනතාවට සමීප කරලීම සඳහා යොදා ගත් දේවල් 02 ක් ලියන්න.

(viii) කිතුනු දරුවෙක් ලෙස ඔබ සතු යහපත් ගුණාංග 02ක් ලියන්න.

(ල. 2×8 = 16)

02.

(i) දෙවියන් වහන්සේ මවන ලද මැවිලි 02ක් නම් කරන්න. (ල. 02)

(ii) දේව මැවිල්ල විනාශ වන ආකාර 03ක් ලියන්න. (ල. 03)

(iii) දේව මැවිල්ල සුරකීම සඳහා ඔබට කළ හැකි දේවල් 03ක් ලියන්න (ල. 06)

03.

(i) චක්‍රාකාරව සිදුවන දේව නිමැවුම් 02 ක් ලියන්න. (ල. 02)

(ii) දෙවි පියාණන් වහන්සේ මිනිසාට දුන් වගකීම් 03 ක් ලියන්න (ල. 03)

(iii) දේව මැවිල්ල ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය වරම් ඉල්ලා දෙවි පියාට යාච්ඤාවක් ලියන්න.

(ල. 06)

04.

(i) දෙවිඳුන්ගේ ස්ථිර ප්‍රේමය තුළ ලැබෙන වරප්‍රසාද 02 ක් ලියන්න. (ල. 02)

(ii) පවුලක් හා සමාජයක් වශයෙන් එකට ජීවත් වීමේදී ලැබෙන විශේෂ වටිනාකම් 03 ක් ලියන්න. (ල. 03)

(iii) දේව ගරු බිය ඇති ජීවිතයක් ගත කිරීමට ඔබට කළ හැකි දේවල් 03ක් ලියන්න. (ල. 06)

05.

(i) ''දරුවන් නොමග යවන පුද්ගලයින්'' සඳහා ජේසුස් වහන්සේ ලබාදුන් දඬුවම කුමක්ද? (ල. 02)

(ii). වර්තමාන සමාජය තුළ දරුවන්ට ඇති පීඩා 03 ක් ලියන්න. (ල. 03)

(iii). පීඩාවන්ට ලක්වී සිටින ඔබේ සහෝදර සහෝදරියන් වෙනුවෙන් ඔබට කළ හැකි දේවල් 03 ක් ලියන්න. (ල. 06)

06.

(i) '' පියාණෙනි ඔබ කැමති සේක් නම් මේ කුසලාන මාගෙන් පහ කළ මැනව'' මෙසේ පැවසුවේ කවුද?. කොහේදී ද? (ල. 02)

(ii) ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා නම් කරන්න. (ල. 03)

(iii). ඔබේ ජීවිතයට පැමිණෙන පරීක්ෂා ජය ගැනීමට අවශ්‍ය ශුද්ධාත්ම දිරිය හා සවිය අයදිමින් යාච්ඤාවක් ලියන්න. (ල. 06)

07 ශ්‍රේණිය

පළමු වාර පරීක්ෂණය - 2019

ක්‍රිස්තියානි ධර්මය

පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | |
|---|---|---|---|---|
| 01. (2) | 02. (4) | 03. (1) | 04. (3) | 05. (2) |
| 06. ( ✓ ) | 07. ( × ) | 08. ( ✓ ) | 09. ( × ) | 10. ( ✓ ) |

11. දෙවියන් වහන්සේ.
12. මනුෂ්‍යයා
13. පෙර මග දූතයාය.
14. ආලෝකයය.
15. ප්‍රඥාවේ උල්පත වේ.
16. ඒදන් උයනේ.
17. ක්‍රියාවෙන්
18. සමිඳාණන් වහන්සේ
19. ස්නාවක ජොහාන්
20. ධර්මිෂ්ඨකම

II. කොටස

01.

(I). අයකැමියන්/ කාන්තාවන්/ දරුවන්/ රෝගීන්/ දිළිඳුන්

(II). කඳු මුදුන්/ මිටියාවත්/ මුහුදු වෙරළ

(III). '' අනුන් ඔබට යමක් කරනවාට ඔබ කැමතිද, ඔබත් ඒ දේම ඔවුන්ටත් කරන්න.

(IV). නිහතමානී බව/ සරල බව/ අවංක බව

(V). ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය/ ශ්‍රී ලංකා පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය පරිවාස හා ළමා රක්ෂණ දෙපාර්තමේන්තුව/ එක්සත් ජාතීන්ගේ ළමා රක්ෂණ අරමුදල.

(VI). වැරදි කරන අයට සමාව දීම/ අසරණ අයට අනුකම්පා කිරීම/ පාපයෙන් මුදවා ගැනීම/ සුවය අපෙක්ෂා කරන්නන් සුවපත් කිරීමට පිහිට වීම.

(VII). බැටළුවන්/ අඹ/ ලුණු/ දැල්වූ පහන්/ අත්තික්කා ගස්

(VIII). සමාව දීම/ අන් අයට පිහිට වීම/ දෙමාපියන්ට සැලකීම/ ගුරුවරුන්ට කීකරු වීම/ ඉවසීම.

(ල. 2 X 08 = 16)

02.

(I). අහස/ පොළාව/ ගස්/ සත්තු/ ඉර/ හඳ/ මිනිසා (ල. 02)

(II). ගස් කපා වනාන්තර එළි පෙහෙලි කිරීම/ අපවිත්‍ර ජලය පිරිසිදු ගංගාවලට මුදා හැරීම/ වායු දූෂණය/ පරිසර දූෂණය. (ල. 03)

(III). නිවස අවට පරිසරය සුරකීම/ පොලිතින් ප්ලාස්ටික් භාවිතය අවම කිරීම/ ගස්වැල් සිටවීම/ සම්පත් අරපිරිමැස්මෙන් භාවිතය පාසල තුළ ක්‍රියාත්මක වන පරිසර සුරකීමේ සංවිධාන වලට සම්බන්ධ ක්‍රියා කිරීම. (ල. 06)

03.

(I). වැස්ස අති වීම/ හදවතෙහි ක්‍රියාකාරීත්වය/ දිවා රෑ ඇතිවීම/ නව දරු උපත්/ බීජයකින් පැළයක් හට ගැනීම. (ල. 02)

(II). දරු සම්පත් ලබා වර්ධනය වීම/ පොළොව පුරා පැතිර එය පාලනය කිරීම/ සතුන් නඩත්තුව හා පාලනය/ භූමිය රැකගෙන එය වගා කිරීම. (ල. 03)

(III). ශිෂ්‍යය පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න. (ල. 06)

04.

(I). නිරෝගී ජීවිතයක්/ ප්‍රේමයේ හා දයාවේ ජීවිතයක්/ සියලු පාපයෙන් මුදන ලද ජීවිතයක්/ යුක්තිගරුක සාධාරණ ජීවිතයක් (ල. 02)

(II). ආදරය/ රැකවරණය/ පරිත්‍යාගය/ ධෛර්යවත් කිරීම. (ල. 03)

(III). දේව වචනය හැදෑරීම/ දිනපතා යාච්ඤාව/ යහපතට මුල්තැන දීම/ ඉරුදින දේව මෙහෙයට සහභාගී වීම. (ල. 06)

05.

(I). 'ඔහුගේ ගෙල වටා ඇඹරුම් ගලක් එල්ලා මුහුදු ගැඹුරෙහි ගිල්වා දැමීම' (ල. 02)

(II). දුප්පත්කම නිසා ඇතිවන බලපෑම/ පාරිසරික හානි හේතුවෙන් විවිධ අතවර අපචාරා වලට ගොදුරු වීම/ ළමා මෙහෙකාර සේවය. (ල. 03)

(III). තමා සතු දේ බෙදා ගැනීම/ ආදරය කිරීම/ යාච්ඤා කිරීම. (ල. 06)

06.

(I). ජේසුස් වහන්සේ, ගෙත්සෙමන උයනේදී (ල. 02)

(II). ගල් ගෙඩිය පාන් ගෙඩියක් වන්නට අණ කිරීම/ යක්ෂයාට නමස්කාර කිරීම/ දේව මාළිගාවේ කොත මුදුනෙන් පහතට පැනීම. (ල. 03)

(III). ශිෂ්‍ය පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 06)